# කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනය

සුදේශ් දිසානායක

## හැඳින්වීම

ආසියාතික දාර්ශනික ප්‍රවනතා අතර චීන දර්ශනය සුවිශේෂී වන්නේ එය එයට ම ආවේණික වූ අනන්‍යතාවයකින් සමන්විත බැවිනි. කොන්ෆියුසියානු දර්ශනය චීන දාර්ශනික සම්ප්‍රදායන් අතර එකක් වන අතර එහි ආරම්භකයා කොන්ග් ගුරුතුමා (Master Kong) හෙවත් කොන්ෆියුසියස් තුමා (පූ.ව්‍ය.ව. 551-479) ය. නූතන බටහිර දර්ශනය එක් එක් විෂය ක්ෂේත්‍රයන්ට විභේදනය කළ හැකි සහ විවිධ කේවල දාර්ශනික උපවිෂය ක්ෂේත්‍රයන්හි විශාරදත්වයක් දක්වන නොයෙකුත් දාර්ශනික සම්ප්‍රදායන්ගෙන් සමන්විත ය. කොන්ෆියුසියානු දර්ශනය අනෙකුත් ආසියාතික දාර්ශනික සම්ප්‍රදායන්හි මෙන් පොදුවේ විවිධ තේමාවන් නියෝජනය වූ සංයුක්ත දාර්ශනික විග්‍රහයක නිරත වේ. මේ නිසා, කොන්ෆියුසියානු දර්ශනයේ අධ්‍යාපනයට පමණක් සීමා වන දර්ශනයක් මෙහි දැකිය නොහැකි ය. එහෙත්, මෙහිදී කොන්ෆියුසියානු පොදු දාර්ශනික විග්‍රහයන් අතර අධ්‍යාපනය පිළිබඳ මොවුන්ගේ මතවාදය වෙන්කර ගැනීමට උත්සහ කෙරේ.

මුල් ගුරුතුමා, දස දහසක් පරම්පරාවන්ගේ ගුරුතුමා සහ පළමු වැනි පෞද්ගලික ගුරුතුමා වශයෙන් කොන්ෆියුසියස් ප්‍රසිද්ධ වීමෙන් (Berthrong & Nagai-Berthrongohn, 2004: 46) සාම්ප්‍රදායික චීන අධ්‍යාපනය කෙරෙහි කොන්ෆියුසියානු දර්ශනයේ බලපෑම පැහැදිලි වේ. එහෙත්, කොන්ෆියුසියස් චීන දර්ශනයට නව්‍ය මතවාදයක් නිර්මාණය නොකළ අතර කොන්ෆියුසියස් හැඳින්වෙන්නේ චෞ ආදිපාදවරයා විසින් සකස් කරන ලද චින්තනය අනාගතයට සම්ප්‍රේෂණය කරනු ලැබූවෙකු වශයෙනි. එය කෙසේ වෙතත්, කොන්ෆියුසියස් පෞද්ගලික අධ්‍යාපනය ආරම්භ කළ ආදිතම ගුරුවරුන් අතර එක් ආචාර්යවරයෙකි. ඔහු පොදු ජනයාට සහ දුප්පතුන්ට අධ්‍යාපනය ව්‍යාප්ත කළ දාර්ශනිකයෙකි. (Yao, 2000: 16) මේ නිසා, මොහුගේ මෙම පොදු ජනයා කේන්ද්‍ර කොටගත් අධ්‍යාපන

ක්‍රමවේදය පැරණි චීන සමාජයේ සුවිශේෂී බුද්ධිමය විපරිවර්තනයන් ඇති වීමට හේතු වී ඇත.

මෙම අධ්‍යයනයෙහි දී, සම්භාව්‍ය කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනය හා සම්බන්ධ මූලධර්මයන්ට සහ මතවාදයන්ට පමණක් සීමා වන අතර නව්‍ය කොන්ෆියුසියානු අධ්‍යාපන දාර්ශනික මතවාද හෝ අධ්‍යාපන ව්‍යුහයන් (නිදර්ශන වශයෙන් විභාග පටිපාටිය, අධ්‍යාපනය ලබාදීම සහ අධ්‍යාපනය ලබාදීමේ උපක්‍රමාදිය) කෙරෙහි අවධානය යොමු නොකෙරේ. එය මෙම පර්යේෂණයේ අධ්‍යයන සීමාවට අදාළ නොවීම ප්‍රධාන හේතුව වේ.

**කොන්ෆියුසියානු අධ්‍යාපනය සහ එහි මූලික සංකල්ප**

අධ්‍යාපනය යන්න කොන්ෆියුසියානු දර්ශනයෙහි සංකීර්ණ වූ දාර්ශනික ප්‍රවේශයකි. එය සියලු සමාජීය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි නිර්මාණය වූවක් බැව් පෙනේ. කොන්ෆියුසියානු අධ්‍යාපන ක්‍රියාවලිය කියවීම, අවබෝධය සහ සාකච්ඡා කිරීම වැනි ප්‍රාථමික ලක්ෂණයන්ගෙන් සමන්විත වේ. එය හුදු ශාස්ත්‍රීය විෂයකට පමණක් සීමා නොවේ. ''කොන්ෆියුසියානු ඉගෙනීම'' අභ්‍යන්තර සහ බාහිර භාවිතය තුළින් ස්වර්ග ලෝකයේ මාර්ගය (Way of heaven) අධ්‍යයනය කෙරේ (Yao, 2000: 30). සාම්ප්‍රදායිකත්වය පිළිබඳ අදහස කොන්ෆියුසියානු දර්ශනයේ මූලික වූවක් බැවින් අධ්‍යාපනයෙන් ද සාම්ප්‍රදායිකත්වයට උසස් ස්ථානයක් ලබා දී ඇත. ඇතැම් මූලාශ්‍රයන්ට අනුව, ෂූන්ෂි නම් ආචාර්යවරයා ප්‍රකාශ කරන්නේ ගුරුවරු ශිෂ්‍යයා ආකෘතිගත කිරීමට අධ්‍යාපනය භාවිත කරන අතර දරුවන්ට දෙමව්පියන් කෙරෙහි ප්‍රේම කිරීමට සහ පුත්‍රවීමට (filial) ඉගැන්විය යුතු බවයි (Little john, 2011: 58). මේ හෙයින්, අධ්‍යාපනය කොන්ෆියුසියානු මූලික දාර්ශනික අභිමතාර්ථ සමඟ අතිශය අනුකූලතාවයක් දක්වන බැව් පෙනේ.

ඇතැම් කොන්ෆියුසියානු ඉගැන්වීම්වලට අනුව, ඉගෙනීමේ මාර්ගයෙන් නැතිවූ හදවත හෙවත් හෘදය සාක්ෂිය වැනි උසස් ගුණාංග ලබා ගැනීමට පිළිවනි (Mengzi. 6a.2.1-3). මේ මාර්ගය තුළ දැනුම යන්න ඉතා සුවිශේෂී වන අතර ලුන්-යූ (Chinise: Lun Yu/ English: The Analects) ග්‍රන්ථය දැනුම කොටස් තුනකට වර්ග කොට දක්වයි. එය (1) ආචාර ධර්මීය හෝ සදාචාර දැනුම, (2) සදාචාරාත්මක

නොවන දැනුම හෝ ප්‍රායෝගික දැනුම, (3) කර්මාන්තමය දැනුම වශයෙන් දැක්විය හැකි ය. පළමු වැන්න බෙහෙවින් වැදගත් වන අතර සැබෑ ජීවිතයේ සෑම විට ම පුහුණු කළ යුතු වේ. දෙවැන්න සාහිත්‍ය අධ්‍යයනයන්හි පුළුල් වශයෙන් අන්තර්ගත වේ. තෙවැන්න කර්මාන්ත ක්ෂේත්‍රයේ නියෝජනය වන්නකි. කොන්ෆියුසියානු ආචාර්යවරු විසින් මෙම අධ්‍යාපනය කාලානුරූපී ව සහ ක්‍රමානුකූලව ශිෂ්‍යයාට ලබාදීමට කටයුතු සකසා ඇත. මේ නිසා, මෙම අධ්‍යාපනය පුද්ගලයෙකුගේ ජීවිතයේ විවිධ අවධීන් ආවරණය වන පරිදි නිර්මාණය වේ. එය ශිෂ්‍යයාගේ කායික සහ මානසික වර්ධනය තුළින් සැකසෙන පුද්ගල බුද්ධිමය ධාරිතාවට යෝග්‍ය අධ්‍යාපනය ලබා දීමකි. සදාචාරාත්මක සහ ප්‍රායෝගික වැනි විවිධ බුද්ධිමය ක්ෂේත්‍රයන්ට අයත් දැනුම් කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනයේ අන්තර්ගත වීමෙන් ආචාර ධර්මීය, දේශපාලනික සහ කර්මාන්ත වැනි සියලු සමාජීය ක්ෂේත්‍රයන් ආවරණය වන ආකාරයට මෙම දර්ශනයේ දැනුම් පද්ධතිය ව්‍යාප්ත වී ඇත. ඉහත කොටස් තුළින් පෙනෙන අනෙක් වැදගත් ලක්ෂණය නම් මෙම දැනුම් පද්ධතිය ආචාර ධර්මීය, ආගමික, දේශපාලනික සහ කර්මාන්ත යනාදි විවිධ ක්ෂේත්‍රයන්හි එක් අන්තයක් පමණක් නියෝජනය නොකිරීමයි. එනම්, එය සියලු ම බුද්ධිමය ලක්ෂණයන්ගේ මිශ්‍රණය තුළින් පරිපූර්ණ අධ්‍යාපනික පසුතලයක් නිර්මාණය කිරීමයි. මෙම ලක්ෂණය කොන්ෆියුසියානු අධ්‍යාපනය ප්‍රායෝගිකවාදී මුහුණුවරක් ගනු ලබන බවට පෙනෙන පැහැදිලි සාධකයක් වේ.

කොන්ෆියුසියානු අධ්‍යයන ක්‍රියාවලියෙන් පුද්ගලයෙකුගේ දැනුමේ සීමාවන් පැහැදිලි ව දැක්වීමක් පෙනේ. ලුන්-යූ ග්‍රන්ථයට අනුව, දන්න දේ දන්නා බවත් නොදන්න දේ නොදන්න බවත් දැනගැනීම සැබෑ දැනීමයි. මෙයින් දැනුම පිළිබඳ අන්තවාදී මුහුණුවර හෙවත් කිසියම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ලබන පුහුණුවෙන් හෝ අභ්‍යාසයෙන් හෝ අධ්‍යාපනයෙන් හෝ සියලු දැනුම් පද්ධතීන් සාක්ෂාත් කරගැනීමට හෙවත් ''සියල්ල දත් තත්ත්වයට'' පත්වීමට හැකි බැව් ප්‍රකාශ වන මතය ප්‍රතික්ෂේප වේ. මෙහි කිසියම් නිශ්චිත කාලාවකාශයක් තුළ ලබන දැනුම පිළිබඳ සීමා සලකුණු කිරීමක් දැකිය හැකි ය. තවද, මෙම ක්‍රියාවලියෙහි දී, අධ්‍යාපනය සහ අත්දැකීම් අතර පරතරයක් නොදක්වන (Berthrong & Nagai-Berthrongohn, 2004) බැවින් පුද්ගල ශක්‍යතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

එහිදී, විචක්ෂණශීලී චින්තනය ප්‍රධාන වූවකි. ලුන්-යූ ග්‍රන්ථයට අනුව, (1) යමෙකුගෙන් අධ්‍යාපනය ලැබීම සහ (2) අධ්‍යාපනය ලබන්නා සැම විටම ''විචක්ෂණශීලී ව සිතීම'' එකිනෙකට ප්‍රතිබද්ධ වූවකි. පළමුවැන්න තොරවීමෙන් වික්ෂිප්ත භාවයත්, දෙවැන්න නොසලකා හැරීමෙන් අන්තරාදායකයන්ට මුහුණ දීමට සිදු වේ (Analects. 2.15). මේ හෙයින්, ශිෂ්‍ය හෝ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් වෙනුවට ශිෂ්‍යයා සහ ගුරුවරයා යන පාර්ශ්ව දෙක ම නියෝජනය වන මිශ්‍ර අධ්‍යාපන ක්‍රමය මෙයින් නිරූපණය වේ. නමුත්, මෙය නූතන ශිෂ්‍ය හෝ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය හරහා නිරූපණය කෙරෙන දාර්ශනික අර්ථයෙන් විග්‍රහ කිරීමට පරිස්සම් විය යුතු වේ.

### උගත් පුද්ගලයා

කිසියම් ක්ෂේත්‍රයක් පිළිබඳ උසස් ආකාරයක දැනුමක් ඇති පුද්ගලයෙක් උගතෙකු ලෙස කෙටියෙන් සඳහන් කළ හැකි ය (Merriam-Webster, 2025). කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනය තුළ උගත් පුද්ගලයා කාණ්ඩගතකරණයකට ලක් වේ. එනම්, උගතුන් වර්ග දෙකකට වෙන් කරන කොන්ෆියුසියස් ඔවුන් පිළිවෙළින් (1) සත්පුරුෂ උගතුන් (jun zi ru) සහ (2) පහත් පෙළේ උගතුන් (xiao ren ru) වශයෙන් (කරුණාසිංහ, 2010: 42) නාමකරණයකට ලක් කරයි. තවද, කොන්ෆියුසියානුවෝ කීර්තිය සහ වාසනාව ගැන පමණක් උනන්දු වන විද්වතෙකු පරිපූර්ණ බුද්ධිමතෙකු ලෙස නොසලකති. ඇතැම් විට, සරල හා නොවියත් සාමාන්‍ය ජනයා කොන්ෆියුසියානු දර්ශනයෙන් නිරූපිත සදාචාරාත්මක පණිවිඩයට අනුව කටයුතු කිරීම මෙයට හේතුවයි (Berthrong & Nagai-Berthrongohn, 2004: 56). මේ නිසා හුදු ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවෙන් උගතෙකු වීමට උත්සාහ ගැනීම කොන්ෆියුසියානු දාර්ශනිකයන් නිශ්චය කොට ඇති උගතා පිළිබඳ මිනුම් දඬු ප්‍රතික්ෂේප කිරීමකි.

සැබෑ උගත් පුද්ගලයෙකු වීමට නම් එම පුද්ගලයා සතු උසස් මනෝමය විභවතාවන් නැතහොත් ආකල්පයන්ගේ ස්වභාවය මෙම සම්ප්‍රදායේ අවධානයට යොමු වී ඇත. මෙහි අධ්‍යාපනය ලබන පුද්ගලයන් දැනුම ලබා ගැනීම කෙරෙහි දක්වන ආකල්පයන්ට අනුව ශ්‍රේණිගත කිරීමකට ලක් වේ. (1) උසස්ම ශ්‍රේණිය ඉගෙනීමෙන් තොර ව

ලබන සහජ දක්ෂතාවයකි. (2) දෙ වැනි ශ්‍රේණිය ඉගෙනීමෙන් පසු ව දැනුම ලබාගනී. (3) තෙ වැනි ශ්‍රේණිය ඉගෙනුමේ දුෂ්කරතාවයන් අත්විඳිනු ලැබුව ද ඒ සියල්ල මැඩ පැවැත්වීමට සමත් වේ. (4) පහළ ම ශ්‍රේණිය දුෂ්කරතාවයන් මැඩපැවැත්වීමට උත්සහ නො ගනී (Hung, 2015: 86). මෙම වර්ගීකරණය තුළ පුද්ගල විවිධත්වය නියෝජනය වේ. විවිධ ඡානමය හෝ වෙනත් හැකියා පුද්ගලයෙකු සතු විය හැකි ය. එය ඔහු හෝ ඇය උපතින් ම හෝ පුහුණුවෙන් ලබන දෙයක් ලෙස ඉහත සඳහන් පළමු සහ දෙවන වර්ගීකරණයන්ට අනුව පැවසීමට පිළිවනි. නමුත්, මෙහි ශක්තිමත් මනෝමය විභවතාවයක් සහිත පුද්ගලයා ලෙස දැකිය හැකි වන්නේ තෙවැනි පුද්ගලයා ය. එවැනි පුද්ගලයකු අතිශය පීඩනයන්ට ලක්විය හැකි ය. නමුත් අවසානයේ දී, ඔහු තුළ සාර්ථක ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ හැකියාවක් පවතින බැව් මෙයින් පෙනේ. අවසාන කොටස කෙරෙහි අවධානය යොමු නොකළ යුතු වන්නේ, එබඳු මනෝමය ශක්‍යතාවයක් ඔවුන් තුළ නොතිබීම නිසාවෙනි. මෙම වර්ගීකරණයෙහි දැකිය හැකි සුවිශේෂී ලක්‍ෂණය නම් නියතිවාදය හෝ ස්වච්ඡන්දතාවය විශේෂයෙන් ද නියතිවාදය සහ ස්වච්ඡන්දතාවය සාමාන්‍යයෙන් ද පිළිගැනීමයි. නිදර්ශන වශයෙන් මෙම කාණ්ඩ වෙන වෙනම ගත්කල්හි, පළමු පිරිස උපතින්ම තම හැකියාව සහිත ව මෙලොවට පැමිණේ. අනෙක් පිරිස් තම විභවතාවයන්ට අනුව කටයුතු කිරීමෙන් ස්වකීය ඉච්ඡාවට අනුව කටයුතු කරන අතර එයට අනුව ම ප්‍රතිඵල භුක්ති විඳී.

**උසස් පුද්ගලයා/පරමාදර්ශී පුද්ගල ස්වභාව**

මෙම දර්ශනයෙහි දැකිය හැකි පුද්ගල චරිත ස්වභාවයන් අතර උසස් හෙවත් පරමාදර්ශී පුද්ගලයා (gentleman) අන් කිසිවෙකුට හෝ දෙවැනි වන චරිත ස්වභාවයකින් යුක්ත වූවෙකු නොවේ. ඔහු තුළ චරිත ලක්‍ෂණ 04ක් දැකිය හැකි ය. (1) හැසිරීමේ දී විචක්ෂණශීලී වීම, (2) උසස් නිලධාරීන්ට සේවය කිරීමේ දී ගෞරවනීය වීම, (3) සාමාන්‍ය ජනතාව පිළිබඳ සොයා බැලීමේ දී සැලකිලිමත් වීම සහ (4) සාමාන්‍ය ජනතාව සේවයේ යෙදවීමේ දී නිවැරදි දේ අනුගමනය කිරීම යන ලක්‍ෂණ කොන්ෆියුසියානුවන් විශේෂයෙන් අවධාරණය කරයි. මෙම චරිත ලක්‍ෂණ තුළින් පෙනෙන සුවිශේෂී කරුණ නම් කොන්ෆියුසියානු මූලධර්ම අනුගමනය කරමින් තම

චර්යාවන්, දියුණු කිරීම සහ එමගින් රාජ්‍යයේ උසස් නිලධාරීන් සහ පොදු ජනතාව යන සමාජ කණ්ඩායම් සමඟ සූක්ෂම සහ තීක්ෂණ නුවණින් කටයුතු කිරීමට ශක්‍යතාවක් පවතින පුද්ගලයෙකු නිර්මාණය කිරීමයි. තවද, උසස් මිනිසා තම මිතුරන්ට ප්‍රේමයේ මාර්ගයෙන් උපදෙස් දෙන අතර (එසේ නොවන) කුඩා මිනිසා පහසුවෙන් අණ කිරීමේ මාර්ගයෙන් අවවාද දෙන (Analects, 17.4) බැව් කොන්ෆියුසියානු විග්‍රහයන්හි අන්තර්ගත වීමෙන් ප්‍රේමය වැනි යහපත් සදාචාරාත්මක ගුණාංගයන් උසස් චර්යාවට අයත් වන අතර අණ කිරීම ආදී සමාජ පීඩිත සදාචාර විරෝධී ගුණාංග පහත් පෙළේ චර්යා ලක්ෂණ ලෙස සැලකිය හැකි ය.

කොන්ෆියුසියානු විශ්ලේෂණයන්ට අනුව උසස් පුද්ගලයා ක්‍රියාවෙහි සක්‍රියවීමට රුචිකත්වයක් දරනමුත් කථාවේ ලොල්වීමට රුචිකත්වයක් නො දක්වයි. කථාව පමණක් ඇති එහෙත් යහපත් චර්යාවෙන් තොරවූවෝ හිස් පුද්ගලයන් වන්නේ, නොවෙනස් වන ''සත්ගුණය'' ඇති අයට නිතර කථා කරන්න දෙයක් තිබුණ ද යමක් කියන්නට ඇති අයට නො වෙනස් වන ''සත්ගුණය'' නොමැති බැවිනි. තවද, මිනිසත් බව ඇත්තෝ නොවෙනස් වන ධෛර්යවන්තයෝ වුව ද ධෛර්යවන්තයෝ නොවෙනස්වන මිනිසුන් නොවන බැව් මෙම දර්ශනයෙහි සඳහන් වේ (Analects.15.5). මේ නිසා, රූපික ව මිනිසුන් නොවෙනස් වූ ස්වරූපයන්ගෙන් යුක්ත වුව ද අභ්‍යන්තරගත ගතිකත්වයන්ට අනුව ඔවුන් තුළ විවිධත්වයක් ප්‍රකාශ වන බැව් පෙනේ. මෙම දාර්ශනික සම්ප්‍රදායට අනුව සත්ගුණය සහ මනුෂ්‍යත්වය යනාදී උසස් ගුණයන්ගෙන් තොර වූ ධෛර්යවන්ත භාවය සහ හුදු භාෂණය වැනි ලක්ෂණයන් දෝෂ සහිත අනර්ථකාරී වූවක් වශයෙන් පැවසිය හැකි ය. මෙම දාර්ශනික මතවාද අධ්‍යාපන දර්ශනයට ඍජු ලෙස බලපාන බැවින් එම අධ්‍යාපන දර්ශනය කොන්ෆියුසියානු මූලික දාර්ශනික සාරයෙන් තොර ව සාකච්ඡා කළ නො හැකි ය.

**ශිෂ්‍යයා**

කොන්ෆියුසියානු අධ්‍යාපන ක්‍රමයෙහි ශිෂ්‍යයාගේ ස්වභාවය සහ ඔහු කෙරෙහි දක්වන ආකල්පය සුවිශේෂී වූවකි. අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ශිෂ්‍යයා තුළ සත්‍ය වූ අධිෂ්ඨානයක්

(Gardner, 2014: 20) මෙන් ම, කැපවීමක් පැවතිය යුතු බව කොන්ෆියුසියානුවෝ අවධාරණයෙන් ප්‍රකාශ කරති. ධනාත්මක ආකල්පයන්ගෙන් තොර ව සිදු කරනු ලබන අධ්‍යාපනය වෙනත් බාහිර පාර්ශ්වයක බලපෑමක් හේතු කොටගෙන සිදු වන්නකි. තවද, එය ස්වකීය අධ්‍යාත්මයට අනුරූප නොවන අතර මෙබඳු ස්වරූප ඇති ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා දීමට කොන්ෆියුසියානුවන් රුචිකත්වයක් නොදැක් වූ බව පෙනේ. එමෙන් ම, අධ්‍යාපනය ලබාදීමේ දී ගුරුකුලයේ දාර්ශනික විශ්වාසයන්ගෙන් තොර වූ සංකල්ප ඉගෙනීමට අවශ්‍ය ශිෂ්‍යයන් ඔවුන්ගේ තෝරා ගැනීම් තුළ දක්නට නො හැකි ය. එනම්, මෙම දාර්ශනිකයෝ චෝ සංස්කෘතිය පිළිබඳ ඉගෙනීමට කැමති ශිෂ්‍යයන් කෙරෙහි පමණක් අවධානය යොමු කොට ඇත්තේ එම සංස්කෘතිය ශිෂ්ට ජීවිතයකට අවශ්‍ය සියලු ම පසුතලයන්ගෙන් සමන්විත මූලාශ්‍රයක් වශයෙන් මෙම සම්ප්‍රදායිකයන්ගේ ගෞරවයට පත් වූ බැවිනි (Berthrong & Nagai-Berthrongohn, 2004: 46). තවද, ඩී. කේ. ගර්ඩ්නර්ට අනුව අතීතය යනු හොඳ පිළිවෙළක් ඇති කරන සහ නොකළ යුතු දේ සඳහා 'ආනුභවික දත්ත' සොයා ගත හැකි ඓතිහාසික අත්දැකීම්හි සංචිතයකි (Gardner, 2014: 20). ඒ අනුව, මෙම දාර්ශනික සාම්ප්‍රදායේ විද්වතුන් විසින් කාලීන සමාජීය සහ සංස්කෘතික ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් පැරණි චෝ විශ්වාස පද්ධතියෙහි අන්තර්ගත ව ඇතැයි පිළිගෙන ඇත. මෙම දාර්ශනිකයන් විසින් චෝ අධ්‍යාපනය පිළිබඳ දැඩි රුචිකත්වයක් ඇති ශිෂ්‍යයන් කෙරෙහි ප්‍රධානත්වයක් දීමෙන් පෙනෙන්නේ චෝ අධ්‍යාපන මාදිලිය සමාජීය ප්‍රශ්න නිරාකරණය කිරීමේ ක්‍රමයක් මෙන් ම එය ශිෂ්‍යයන්ගේ අනාගත ජීවිතයට අතිශය වැදගත් වූවක් ලෙස කල්පනා කිරීමයි. එමගින් කොන්ෆියුසියානු දර්ශනයේ අපේක්ෂිත පරමාදර්ශී සමාජය අධ්‍යාපනය හරහා ශිෂ්‍යයන්ට සමීප කෙරේ. මෙහි දී, කොන්ෆියුසියානු අධ්‍යාපනය ශිෂ්‍යයා සහ සම්ප්‍රදාය අතර අතරමැදිකරුවෙකු ලෙස ක්‍රියාත්මක වන ආකාරය සූක්ෂම ව අධ්‍යයන කිරීමෙන් පෙනේ. එය එසේ නොවන්නේ නම්, චෝ අධ්‍යාපනය කෙරෙහි රුචිකත්වයක් ඇති ශිෂ්‍යයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු නොකොට වෙනත් අධ්‍යාපන මාදිලි කෙරෙහි රුචිකත්වයක් දක්වන සහ වෙනත් දාර්ශනික අභිලාෂයන් කෙරෙහි නැඹුරු වූ ශිෂ්‍යයන්ට ප්‍රමුඛත්වයක් දිය යුතු වේ. එහෙත් මෙය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලෙස

හැඳින්විය නොහැකි වන්නේ ගුරුවරයා සහ ගුරුවරයා එල්බගත් සම්ප්‍රදායට අනුගත අධ්‍යාපනයක් ශිෂ්‍යයාහට ලබාදීමත් එයට විරුද්ධ වන ශිෂ්‍යයන් අධ්‍යාපන ආයතනයන් සඳහා තෝරා නොගැනීමත් හේතු කොට ගෙන ය.

ශිෂ්‍යයාහට පුහුණුව ලබාදීමේ දී, ඔවුන් එම ක්‍රියාව විධිමත් ව සිදු කළ යුතු ය. කොන්ෆියුසියානු දාර්ශනික ඉගැන්වීම් තුළ ශිෂ්‍යයන් දැනුම ලබාගැනීම සහ එම දැනුම භාවිත කිරීමට දැනගත යුතු ආකාරය අවධාරණය කරයි. එමෙන් ම, මොවුහු කටපාඩම් අධ්‍යාපනය හෙවත් මතකයෙන් යමක් ප්‍රකාශ කිරීම සැබෑ ඉගෙනීම නොවන බැව් අවධාරණය කරති (Gardner, 2014: 21). තවද, මෙම දාර්ශනිකයෝ ශිෂ්‍යයාගේ දැනුම පිළිබඳ අවබෝධය කුඩා අංගයන්ගේ සිට වඩා විස්තීර්ණ අවබෝධය දක්වා ශිෂ්‍යයා තුළින් ම වර්ධනය කිරීමට අපේක්ෂා කරති (Gardner, 2014: 21). මෙය ශිෂ්‍යයාගේ ඍජු සම්බන්ධතාවයක් සහිත ව සිදු කරනු ලබන ක්‍රියාවකි. මෙයින් විවිධ වයස් කාණ්ඩයන්ට අනුව අධ්‍යාපනය විධිමත් ව කාණ්ඩගත කිරීම සහ ශිෂ්‍යයාගේ මානසික මට්ටමේ ස්වභාවයට අනුරූපව අධ්‍යාපනය ලබා දීමක් නිරූපණය වේ.

අධ්‍යාපනය තරුණ කොන්ෆියුසියානුවන්ගේ ජීවිතයේ වැදගත් අවශ්‍යතාවන් අතර එකක් වී ඇති බැව් පෙනේ (Berthrong & Nagai-Berthrongohn, 2004: 68). තවද, කොන්ෆියුසියස් අධ්‍යාපනය ලබා දීමේ දී සමාජයේ පවතින උසස් සහ පහත් භේදයකින් තොර ව ශිෂ්‍යයාට දැනුම ලබා දී ඇත (කරුණාසිංහ, 2010: 55). ඇතමෙකුට අනුව එකල පුදුමයට කරුණක් නම් කොන්ෆියුසියස්ගේ බොහෝ ශිෂ්‍යයන් සාමාන්‍ය ජන සමාජයට අයිති පුද්ගලයන් වීමයි. නමුත් කොන්ෆියුසියස් ගුරුවරයෙකු සොයා ගිය තරුණ වංශාධිපතියන් ප්‍රතික්ෂේප කොට නොමැත. තවද, උපතට වඩා වැදගත් වන්නේ සදාචාරාත්මක හා බුද්ධිමය හැකියාව බව ඔහුට තදින් ම ඒත්තු ගිය බැව් පෙනේ (Berthrong & Nagai-Berthrongohn, 2004: 46). මෙය, කොන්ෆියුසියානු දර්ශනයෙහි ශිෂ්‍ය කුශලතාවය මූලික කරගනු ලබන ආකාරය සහ සමානාත්මතා මූලධර්මය කෙරෙහි දක්වන ආකල්පය ප්‍රකාශ වන අවස්ථාවකි. එනම්, මෙයින් අධ්‍යාපනය සෑම ශිෂ්‍යයෙකු සඳහා ම උරුම වූවක් ලෙස සලකන අතර සදාචාරාත්මක සහ බුද්ධිමය

හැකියාවෙන් යුක්ත ඕනෑ ම පුද්ගලයෙක් ශිෂ්‍යයෙකු ලෙස අවධාරණය කරයි. එමෙන් ම, කිසියම් ශිෂ්‍යයකු තෝරාගැනීම සඳහා ශිෂ්‍යයාගේ කුලය සහ සමාජය වැනි අධ්‍යාපනය හා කිසිදු සම්බන්ධතාවයක් නොමැති නොයෙකුත් පන්ති භේදයන් සහ ආන්තිකකරණයන් අධ්‍යාපනයෙන් දුරස්ථ කිරීමක් මින් පෙනේ. නමුත්, ජෝන් සහ බර්ත්‍රෝන්ග්ට අනුව කොන්ෆියුසියස් නූතන සමානාත්මතාවාදියෙකු නොවූව ද (Berthrong & Nagai-Berthrongohn, 2004: 45) මෙම ලක්ෂණයන්ට අනුව කොන්ෆියුසියස් තත්කාලීන සමාජ කාලාවකාශයට අනුව කිසියම් ආකාරයක සමානාත්මතාවයක් ඉදිරිපත් කොට නොමැති බැව් ප්‍රකාශ කිරීමට නොහැකි ය.

**කාන්තාව**

ඉතිහාසය පුරා චීන කාන්තාවගේ දුක්ඛිත තත්ත්වය ඓතිහාසික තොරතුරුවලින් මනාව පිළිබිඹු වේ. පාද බැඳීම (Binding of feet), ළදරු ඝාතනය, ආදරය රහිත විවාහ, දෙවන භාර්යාවන්, වැන්දඹු කාන්තාව තම වැඩිමහල් පුතුට කීකරුවීම, වැන්දඹුව සියදිවි නසා ගැනීම සහ උපභාර්යාව (Littlejohn, 2011: 75) යනාදී පැරණි චීන සමාජයේ පැවති කාන්තාවගේ ස්වභාවය පිළිබඳ නිදර්ශන මගින් ස්ත්‍රිය දැඩි ආන්තිකකරණයන්ට ලක්වීමක් දැකිය හැකි ය. කොන්ෆියුසියානු දර්ශනයෙහි ද පුරුෂ මූලිකත්වය අවධාරණය කෙරේ. එහි ස්ත්‍රිය විසින් පුහුණු කළ යුතු අවනත වීම් තුනක් (පියාට, ස්වාමියාට, ස්වාමියා මියගිය පසු වැඩිමහල් පුතාට) සහ ස්ත්‍රියට පොදු වූ සත්ගුණ සතරක් දැක්වේ. එනම්, පුන්‍ය කටයුතු (Charity), විනීතකම (Modesty), නිහතමානීකම (Meekness), ගෘහය පිළිබඳ රුචිකත්වය (domesticity) (Littlejohn, 2011: 75) යනාදි කටයුතුවල නියුක්ත වීම මෙම දර්ශනයෙන් නිර්දේශ කෙරේ. මෙමගින් ස්ත්‍රිය කෙරෙහි උග්‍ර සදාචාරාත්මක සීමාවන් නිර්මාණය කිරීමක් දැකිය හැකි ය. මෙවැනි සදාචාරාත්මක සීමාවන්ගෙන් කාන්තාවගේ තත්ත්වය සුවදායක නොවන අතර කාන්තාව ගෘහයට පමණක් සීමා කෙරේ. අධ්‍යාපනය ලැබීමෙහි දී කාන්තාවට ලැබූ ආස්ථානය පිළිබඳ අවධානය යොමු කරන ජෝන් සහ බර්ත්‍රෝන්ග්ගේ මතය වන්නේ මින්ග් රාජවංශයේ දී (Ming Dynasty, 1368-1644 C.E.) කාන්තාවට කොන්ෆියුසියානු අධ්‍යාපනයට වඩා

වැඩි දෙයක් ලබා ගැනීමට හැකි වූ බවයි. එහෙත්, කොන්ෆියුසියානු දර්ශනය චෝ අධිරාජ්‍යයේ ක්‍රමය (Zhou Dynasty,1045-256 B.C.E.) පදනම් කර ගනිමින් චීන භූමියෙහි ස්ථාපිත වූ පමණින් මෙම යුග එකිනෙක සමඟ තුලනාත්මක ව අධ්‍යයනය කිරීම යුක්ති-යුක්ත නොවේ. මෙම යුගයන් දෙක ඉතා වෙනස් අවධි දෙකකට අයත් වන බැවිනි.

චීන සම්ප්‍රදායේ පැරණිත ම ග්‍රන්ථ කාන්තාවන්ගේ සදාචාරාත්මක අධ්‍යාපනය සඳහා පමණක් කැප කර ඇති අතර එය ඉදිරි සහස්‍ර 12 සඳහා කාන්තා අධ්‍යාපනය සඳහා භාවිත කරන සම්මත කාර්යය බවට පත් විය (Littlejohn, 2011: 73). මේ සඳහා නිදර්ශනයක් ලෙස ආදර්ශවත් කාන්තාවගේ චරිතය (Biographies of Exemplary Women) නම් කෘතිය සඳහන් කළ හැකි ය. මෙය කොන්ෆියුසියානු අදහස් පාදක කොට නිර්මාණය කර ඇති රචනයකි. නමුත්, එය පිරිමින් විසින් කාන්තාවන් සඳහා ලියන ලද කෘතියක් බැවින් එය පිරිමියාට දෘශ්‍යමාන වන සහ ඔහුට අවශ්‍ය කාන්තාවගේ චර්යාව පිළිබඳ රචනයක ස්වරූපය ගනු ලැබේ. එබැවින්, මෙය කාන්තාව පුරුෂ මූලික අදහස් මත සිරකොට තැබීමක් යැයි ප්‍රකාශ කළ හැකි ය.

කොන්ෆියුසියානු අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයන් කෙරෙහි උගත් ස්ත්‍රීන් ඇති කිරීමක් දැකිය නොහැකි ය. මේ සඳහා, කාන්තාවන්හට රාජකාරී කිරීම සඳහා උපදෙස් දීමේ විෂයමාලාවක් පැවති බවට සාක්ෂි නොතිබීම එක් සාධකයකි (Littlejohn, 2011: 73). එහෙත්, කිසිදු කාන්තාවක් කොන්ෆියුසියානු කලාවන්හි ප්‍රවීණතාවයක් නොලැබූ බව සඳහන් කිරීමට නොහැකි වන්නේ බොහෝ කොන්ෆියුසියානු කාන්තාවන්ට ඇතැම් කොන්ෆියුසියානු කලාවන්හි දක්ෂතා පැවතීමත්, බොහෝ දීර්ඝ කාලීන පැරණි සම්ප්‍රදායක් පිළිබඳ අධ්‍යාපනය ලද උගත් කාන්තාවන් පිළිබඳ කොන්ෆියුසියානු සම්ප්‍රදායෙහි දැක්වෙන බැවිනි (Berthrong & Nagai-Berthrongohn, 2004: 68). මේ සඳහා බන් ෂාඕ (Ban Zhao, c.45-116 CE) නිදර්ශනයකි. ඇය හන් යුගයේ සිටි ඉතා වැදගත් කාන්තාවක් මෙන් ම ඉතිහාසඥවරියක් ද වේ (Encyclopedia Britannica, 1 Apr. 2024). ඇය චීන ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයෙකු වන සිමා චියැන්ට (Sima Qian) පමණක් දෙවැනි

වේ. එහෙත්, මෙවැනි සමාජයේ කැපී පෙනෙන කාන්තාවන්ගේ සමාජ සහ පවුල් පසුබිම ඉතා ඉහළ වූවක් ලෙස පෙනේ. නිදර්ශන ලෙස, බන් ෂාඕ වුව ද ඉහළ සමාජ පැලැන්තිය නියෝජනය කරනු ලැබූ කාන්තාවකි. මේ නිසා, කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනයෙන් පොදුවේ චීන කාන්තාවගේ අධ්‍යාපන අයිතිය සහ නිදහස වෙනුවෙන් පිටුවහලක් ලැබුනේ ද යන්න ගැටලු සහගත ය.

බන් ෂාඕ වැනි කාන්තාවන් මෙන් පිරිමින් ද මූලික අධ්‍යාපනය පවුල සහ මව හරහා ලබා ගැනීමෙන් පෙනෙන්නේ පවුලේ අධ්‍යාපන කටයුතු ස්ත්‍රියට පැවරී ඇති වගකීම් අතර එකක් වූ බව මෙන් ම එකල ස්ත්‍රිය ඒ හා සම්බන්ධ ව ප්‍රාමාණික දැනුමකින් යුක්ත වූ බවයි. තවද, කොන්ෆියුසියස්ගේ සහ මෙන්සියස්ගේ (Mencius) මව්වරු, ශ්‍රේෂ්ඨතම චීන ගුරුවරුන්ගේ පළමු ගුරුවරු (Berthrong & Nagai-Berthrongohn, 2004: 68) ලෙස ගෞරවයට පාත්‍රවීමෙන් ද එය තහවුරු වේ. තවද, තරුණ වැන්දඹුවන් තම පුතුගේ අධ්‍යාපනයේ සක්‍රීය භූමිකාවක් දරා ඇත (Berthrong & Nagai-Berthrongohn, 2004: 68). එහෙත් පොදුවේ සමාන්‍ය ස්ත්‍රියට ගෘහය කේන්ද්‍ර කොටගත් අධ්‍යාපනයක් ලබා ගැනීමට අවකාශය ලැබුනත් නිදහස් කොන්ෆියුසියානු අධ්‍යාපනයක් ලැබූ බවට සාධක අප්‍රකට ය. මෙය එක් ආකාරයකට, පුරුෂයාට සාපේක්ෂ ව ස්ත්‍රිය අධ්‍යාපනයෙන් ආන්තිකකරණයකට ලක්වීමක් ලෙස පෙනේ.

**කොන්ෆියුසියානු දර්ශනයේ සදාචාරාත්මක සත්භාවය සහ අධ්‍යාපනය**

කොන්ෆියුසියානු අධ්‍යාපන විශ්ලේෂණය ඉගෙනුම් ක්‍රියාවලියකි. එය අධ්‍යාපන දර්ශනයක් වශයෙන් හැඳින්විය හැකි වන්නේ, සමස්ත කොන්ෆියුසියානු දහම ගැඹුරු දාර්ශනික විශ්ලේෂණයන්ගෙන් යුක්ත වීමත් එයින් පරිබාහිර ව පැවතීමට එම අධ්‍යාපන ක්‍රමයට නොහැකි වීමත් හේතු කොට ගෙන ය. අධ්‍යාපනය දැනුම කේන්ද්‍ර කොට පවතින හෙයින් එහි ඥාන විභාගීය මූලධර්මයන් අන්තර්ගත වේ. එහෙත් එය හුදෙක් ඥාන විභාගයට පමණක් සීමා කොට දැක්විය නොහැකි ය. කොන්ෆියුසියානු අධ්‍යාපනය පරමාදර්ශී පුද්ගලයෙකු (Junzi) වීමට නිශ්චිත දැනුමක් ලබා ගැනීමේ සුවිශේෂී ක්‍රියාවලියක් වශයෙන් නිර්වචන වීම හේතු කොටගෙන ඉගෙනීමේ

සංකල්පය ඥාන විභාගීය වූවක් පමණක් නොව ආචාර ධර්මීය ද වේ (Hung, 2015: 85). තවද, සදාචාරය දර්ශනයෙහි අතිමූලික උපවිෂය ක්ෂේත්‍රයක් වන හෙයින් මෙම අධ්‍යාපනය සදාචාරය සමඟ අනුයුක්ත වන්නේ යැයි සරල ව පැවසිය හැකි ය. එම ස්වභාවයන්ගෙන් වියුක්ත ඇතැම් දර්ශනයන් පැවතිය හැකි බැවින්, යම් අධ්‍යාපනයක් දාර්ශනික මූලයන් සාරය කොටගත් පමණින් සදාචාරාත්මක ලක්ෂණයන්ගෙන් සමන්විත යැයි පැවසීම යුක්ති සහගත නොවේ. නමුත්, සමස්ත කොන්ෆියුසියානු මතයට අනුව ඉගෙනීමෙන් සදාචාර ඉගෙනුම (Gardner, 2014) සිදුවන බැව් අවධාරණය වන හෙයින් ඉගෙනීම සදාචාරයේ පිළිබිඹුවක් නැතහොත් ඉගෙනීමේ සමස්ත ක්‍රියාවලිය සදාචාරය මත පදනම් වන්නක් ලෙස දැක්වීම අයුක්ති සහගත නොවේ.

පොදුවේ කොන්ෆියුසියානු දර්ශනයෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් නම් සදාචාරයට උච්ච ස්ථානයක් ලබා දෙන අතර ම එය ''ඥානය පිළිබඳ සංකල්ප'' සමඟ අතිශය සහසම්බන්ධතාවයකින් යුක්ත වීමයි. එනම්, එහි දැනුම ආචාරධර්මයට අදාළ ව සදාචාරය සහ සත්ගුණය (morality and virtues) ඉතා වටිනා දෙයක් ලෙස සලකනු ලැබේ (Hung, 2015: 87). එහි දී, කොන්ෆියුසියානු සදාචාරය ප්‍රවාද දෙකක් ආශ්‍රයෙන් සංවර්ධනය වීමක් දැකිය හැකි ය. එනම්, (1) යහපැවැත්ම (goodness) ඉගැන්වීමට හා ඉගෙනුමට හැකි වීම මෙන් ම, (2) බුද්ධියේ මාර්ගෝපදේශය යටතේ සමාජය සමගියෙන් සහ සමාදානයෙන් සිටීම යනුවෙනි (Yao, 2000: 25). යහපැවැත්ම අධ්‍යයන සහ අධ්‍යාපන ක්‍රියාවලිය මතින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූවක් ලෙස කොන්ෆියුසියානුවන් කල්පනා කිරීමෙන් පෙනෙනු ලබන්නේ නියතිවාදී දාර්ශනික ස්වභාවය සදාචාරාත්මක පසුබිමෙන් ඉවත් කිරීමට උත්සහ ගැනීමකි. එනම්, පුද්ගලයාගේ රුචිකත්වය, මනා කැපවීම සහ පුහුණුවෙන් ස්වකීය අභ්‍යන්තරයේ පවතින සදාචාර විරෝධී ගතිකයන් නිෂ්කාශනය කරමින් සදාචාරවත් භාවයට පත්වීමත් එම බුද්ධිමය සංයමය සහ මාර්ගෝපදේශයෙන් සමාජයේ යහපැවැත්ම තහවුරු කිරීමත් ය. තවද, ඉහත සඳහන් ප්‍රවේශ දෙකෙන් වක්‍ර ව දැක්වෙන අනෙක් කරුණ නම්, පුද්ගලයාට ස්වයං-වර්ධනයක් ඇති කර ගැනීමට හැකිවීම සහ තනි පුද්ගල යහපැවැත්මෙන් සමස්ත සමාජය දේහය සුඛ-නම්‍ය කිරීමට හැකිවීම ය. එය නූතන අර්ථයෙන්

ගත් කල්හි ලිබරල්වාදී ප්‍රවේශයකි. එහෙත් එබඳු ස්වරූපයක් පැරණි චීනයේ පැවතියේ දැයි මෙබඳු ප්‍රවේශ දෙකක් ඇසුරෙන් පමණක් පැවසිය නොහැකි වන්නේ මෙම මතවාදයට වඩා වෙනස් සංකීර්ණ සමාජ සහ පාලන ක්‍රමයක් පැරණි චීනයෙහි පැවතීම හේතු කොටගෙන ය. කෙසේවුව ද, අධ්‍යාපනයේ මූලික අභිප්‍රාය යහපත් ක්‍රියාවන් ප්‍රවර්ධනය කිරීම සහ සදාචාරාත්මක චරිතයක් වර්ධනය කිරීම (Yao, 2000: 30) මත වැටී ඇති බැවින් සමස්තයක් වශයෙන් අධ්‍යාපනය පුද්ගල සදාචාරය දියුණු කිරීම මත පදනම් නො වේ යැයි පැවසිය නො හැකි ය.

මුල් කාලීන කොන්ෆියුසියානු දාර්ශනිකයන් තිදෙනා (කොන්ෆියුසියස් සහ මෙන්ග්ෂි) අතර එකෙකු වන චුන්සගේ (Xunzi /Hsün Tzu, c. 310—c. 220 B.C.E.) (Elstein, (n.d.). Xunzi.) විශ්වාසය වන්නේ මානව ස්වභාවය ආත්මාර්ථකාමී සහ තමන්ගේ රුචිකත්වය මත කටයුතු කිරීමට ඉඩ සලසන අතර බාහිර සදාචාරයෙහි සහ නීතියේ සීමා නොමැති ව ආත්මාර්ථකාමීත්වයේ නැඹුරුවීම, අවුල් සහ කැලඹිලි (Disorders and Chaos) ඇතිවන බවයි (Little john, 2011: 57). තවද, චුන්ස මානව ස්වභාවය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන අතර ඔහු සියලු සමාජ අහිතකාරක මනෝගතිකයන්ට හේතුව ලෙස 'ලාභ ලැබීමේ ආශාව' නම් කරයි. ඔහුට අනුව එහි සමස්ත ක්‍රියාවලිය මෙබඳු ස්වරූපයක් ගනී. මිනිසාගේ ස්වභාවය නම්, ඔහු තමාට ම ලාභ ලැබීමේ ආශාවෙන් ඉපදීමත් මෙම ස්වභාවය අනුගමනය කිරීමෙන් ආක්‍රමණශීලීත්වය හා තණ්හාව වර්ධනය කිරීමත් ය. එමගින් පුද්ගල ගෞරවය නැති වේ (Knoblock, 1988). සියලු හිතකාරකයන් 'ආත්මාර්ථකාමීත්වය' මත පදනම් වන්නේ යැයි මෙහි අර්ථය සංක්ෂිප්ත ව ප්‍රකාශ කළ හැකි ය. කොන්ෆියුසියානු ''ඉගෙනීම'' පුද්ගලයෙකුගේ ආත්මාර්ථය වෙනස්කොට ගුණවත් දේ රඳවා ගැනීම මත පදනම් වන බැවින් මානව ස්වභාවය සහ දෛවය (destiny) අධ්‍යයනය කිරීම හරහා කොන්ෆියුසියානු ඉගෙනීම වැටී ඇත (Yao, 2000: 3). ගුණවත් හෙවත් සදාචාරවත් මිනිසෙකු නිර්මාණය කිරීම මෙම අධ්‍යාපනයේ එක් අරමුණක් වන අතර එය සමාජයේ පැවැත්මට ඍජු ව බලපෑම් කරනු ලැබේ. කොන්ෆියුසියස් පුද්ගලයාගේ සාමාන්‍ය ස්වභාවික ලක්ෂණයක් වන ආත්මාර්ථකාමීත්වය වෙනුවට

සමාජශීලීත්වය හෙවත් පරාර්ථකාමීත්වය පිළිබඳ ඇගයුම්ශීලීත්වය ඇති කිරීමට අධ්‍යාපනය භාවිත කොට ඇති බව මින් පෙනේ.

කොන්ෆියුසියානු දාර්ශනික විග්‍රහයන්හි ''අනෙකා'' පිළිබඳ අදහස විශේෂ වූවකි. එමගින් තමාගේ පැවැත්ම නිශේධනය කිරීමක් දැකිය නොහැකි ය. මෙම අධ්‍යාපනයෙන් පුද්ගලයා සහ ඔහුගේ හෝ ඇයගේ ස්වකීය සදාචාරාත්මක සහ අධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි (Taylor, 2014: x). තවද, කොන්ෆියුසියස් පැහැදිලි ව විශ්වාස කළ දෙයක් නම් මිනිසුන්ට ඔවුන් විසින් ම පරිපූර්ණ විය හැකි අතර උසස් සදාචාරාත්මක ශක්තීන්ගෙන් යුක්ත මිනිසුන්ට අනෙකාට බලපෑම් කළ හැකි බවයි. මෙහි දී, වැදගත් වන්නේ සෑම පුද්ගලයෙකුට ම අනෙකාට බලපෑම් කිරීමට නොහැකි වීමත් සදාචාරවත් පුද්ගලයාට පමණක් අනෙකා කෙරෙහි බලපෑම් කිරීමට හැකි වීමත් ය. කොන්ෆියුසියානු දර්ශනයේ මූලික සදාචාරාත්මක ඉගැන්වීමක් වන කාරුණිකත්වය (ren 仁) ඇසුරෙන් ද එය පැහැදිලි කළ හැකි ය. මෙම සංකල්පයෙන් අනෙකා සමඟ ඔවුන්ගේ දෘෂ්ටිකෝණයට සාපේක්ෂ ව යහපත් දේ පිළිබඳ හැඟීම සහිත ව අනෙකාට මඟ පෙන්වීම අර්ථවත් වේ (Csikszentmihalyi, 2024). තවද, ලුන්-යූ ග්‍රන්ථයෙහි දී විවිධ ස්ථානයන්හි මෙම සංකල්පය පිළිබඳ නොයෙක් අර්ථයන් දැක්වුව ද පොදුවේ ''අනෙකා පිළිබඳ සැලකිලිමත් වීම'' යන අර්ථයෙහි එය භාවිත කළ හැකි ය (Analects.12.22). මේ නිසා අනෙකා සමඟ දයානුකම්පාවෙන් කටයුතු කිරීම කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනයෙහි දැකිය හැකි මූලික ලක්ෂණයකි.

ලුන්-යූ ග්‍රන්ථයට අනුව උසස් පුද්ගලයෙකුගේ හැසිරීම් පහක් සඳහන් වේ. එය කාරුණිකත්වය (ren 仁), ධාර්මිකත්වය (yi 義), අභිචාරාත්මක සාමර්ථය (li 禮), බුද්ධිය (zhi 智) සහ විශ්වසනීයත්වය (zhi 智) යනුවෙන් නම් කළ හැකි ය. පළමු වැන්නෙන් අනෙකාගේ දෘෂ්ටිකෝණයට අනුව යහපත් හැඟීමෙන් මග පෙන්වීම, දෙවැන්නෙන් පොදු වගකීම, තෙවැන්නෙන් යමෙකුගේ සමාජ තත්ත්වය සහ බහුවිධ අභිචාරමය භූමිකාවන් ඉටු කිරීමට ඇති කැමැත්ත ප්‍රකාශ කිරීම, සිව්වැන්නෙන් අනෙකාගේ වංක සහ ඍජු චර්යාවන් ප්‍රත්‍යක්ෂ කර ගැනීම සහ පස්වැන්නෙන් පාලන ක්‍රියාවලියේ දී රජෙකුට හෝ නිලධාරියෙකුට අවශ්‍ය උපදෙස් ලබාදීම (Csikszentmihalyi, 2024)

යන කාර්යයන් නිරූපිත ය. මෙම කාර්යයන් නාමික ව එකිනෙකින් වෙන් කොට දැක්වුව ද එහි සාමාන්‍ය ක්‍රියාවලියෙහි දී හුදු වියුක්ත ස්වභාවයකින් තොර වූ අන්තර් සම්බන්ධතාවයක් පෙනේ. මෙම සදාචාරාත්මක ලක්ෂණයන් කොන්ෆියුසියානු අධ්‍යාපනයේ ප්‍රාථමික සාරයන්හි අන්තර්ගත වීමෙන් දැකිය හැකි කරුණ නම් සදාචාරයෙන් පරිපූර්ණ මිනිසෙකු බිහිකිරීමට කොන්ෆියුසියානු අධ්‍යාපනයේ මූලික අපේක්ෂාව වීමයි.

**කොන්ෆියුසියානු දර්ශනයේ සම්භාව්‍ය ග්‍රන්ථ**

කොන්ෆියුසියානු ලේඛනයන්හි අධ්‍යාපනය ප්‍රධාන වූවක් (Gardner, 2014: 7) ලෙස සලකන බැවින් මෙම අධ්‍යාපන දර්ශනයෙහි දී සම්භාව්‍ය ග්‍රන්ථ කෙරෙහි දැඩි භක්තිමත් ආකල්පයක් දක්වයි. මෙම ග්‍රන්ථයන්හි අධ්‍යාපනය පිළිබඳ මූලික පදනම රඳා පැවතීම මෙයට හේතුවකි. පොදුවේ සියලු කොන්ෆියුසියානු අධ්‍යාපනඥයෝ 'සෙවීම' කෙරෙහි ශිෂ්‍යයා නැඹුරු කිරීම ස්වකීය සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනයන් ශිෂ්‍යයාට හඳුන්වා දීමේ හොඳම ක්‍රමය වශයෙන් විශ්වාස කළ හ (Berthrong & Nagai-Berthrongohn, 2004: 51). නමුත් මෙම සෙවීමේ අවසානයෙහි දී නව්‍ය ඥානයක් උත්පාදනය කරන්නේ ද යන්න ගැටලු සහගත ය. අලුත් ග්‍රන්ථ නිර්මාණය කිරීමක් එම දර්ශනයෙන් සිදු නොවීම මෙයට ප්‍රධාන සාධකයයි. කොන්ෆියුසියානු ප්‍රකාශය වන්නේ 'තමන් කිසිවක් නිර්මාණය නො කරන අතර තමන්ට ඉගැන් වූ දෙය පමණක් සම්ප්‍රේෂණය කරන' බවයි (Analects.7.1). ඔහුගේ නියමයන්ට සහ පැරණි සම්ප්‍රදායන්ගේ මූලාශ්‍රයන්හි සොයාගත් සියලු අදහස්වලට අනුගතව එහි අන්තර්ගතයන්හි සැකයෙන් තොර සත්‍ය චිත්‍රණය වන්නේ යැයි ආතර් වැලී කල්පනා කරයි (Confucius., Waley, 2000: xii). මින් පැරණි කෘතීන්හි අන්තර්ගතයන් සහ කොන්ෆියුසියානු දර්ශනය අතර කිසියම් හෝ පරස්පරතාවයක් අප්‍රකට බැව් පෙනේ. තවද, මෙයින් පෙනී යන කරුණ නම් සංකල්පගත කරන ලද යුතෝපියාවකට අනුව අධිසම්ප්‍රදායවාදී ව අධ්‍යාපන ක්‍රමය සැකසීමට මූලික අඩිතාලම සම්භාව්‍ය ග්‍රන්ථ මගින් සැකසී ඇති බවයි. එමෙන් ම, පැරණි කෘති විවරණය කිරීම, නව කෘති රචනා නො කිරීම, පැරණි දේ කෙරෙහි දැඩි විශ්වාසය හා ලැදියාව තැබීම සහ පෞරාණික දැනුම් පද්ධතිය තුළ සමස්ත චින්තන පද්ධතිය සීමා

කිරීම හෙවත් සිරගත කොට තැබීම තුළින් නව දැනුමක් නිර්මාණය කිරීමට කොන්ෆියුසියානුවන් තුළ රුචිකත්වයක් නොතිබීම හෝ එවැනි තත්ත්වයක් ඇතිවීමට අවකාශයක් නිර්මාණය නොකිරීමට එම සංස්ථාව නියෝජනය කරනු ලබන බලධාරීන් කටයුතු කොට ඇතැයි පිළිගත හැකි ය.

මූල කෘති කෙරෙහි අවධානය යොමු කිරීමේ දී, කොන්ෆියුසියානු අධ්‍යාපනයේ වැදගත් ලක්ෂණ 02ක් දැකිය හැකි ය. එනම් (1) මූල කෘති කියවීම සහ (2) ග්‍රන්ථ භාවිත කරන ආකාරය ඉගෙන ගැනීම - ඒවා අජීවී වචන පමණක් නොව සජීවී පාඨ බවට පත් කිරීම සඳහා ස්වකීය කියවීම හරහා එහි අර්ථය අවබෝධ කරගැනීම කළ යුතු වේ (Berthrong & Nagai-Berthrongohn, 2004: 56). මෙම සම්ප්‍රදායෙහි මූල කෘති කිහිපයක් දැකිය හැකි ය. විපරිණාමයේ ග්‍රන්ථය (Book of Changes/ I Ching), සොන්ග් පොත (Book of Song/Sòng Shū), ඉතිහාසයේ පොත (Book of History/ Shūjīng) ලුන්-යූ (Analects/ Lúnyǔ) යනාදී ග්‍රන්ථ මේ සඳහා නිදර්ශන වේ (Confucius., Waley, 2000: xii). මෙහි කොන්ෆියුසියානු දාර්ශනික සාරයන් අන්තර්ගත වේ. ඉහත සඳහන් ලක්ෂණ දෙක සඳහා මෙම කෘති තුලනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් පෙනෙනු ලබන සුවිශේෂී ලක්ෂණය නම්, කොන්ෆියුසියානු දර්ශනයේ මූලික සිද්ධාන්ත පිළිබඳ ශිෂ්‍යයාට පැහැදිලි සහ ග්‍රන්ථයන්හි පවතින ආකාරයෙන් අවබෝධයක් ලබාදීම සහ ඒ අනුව පුද්ගල චර්යාව හැඩගැස්වීමට මෙම සම්ප්‍රදායවාදීන් උත්සුක වී තිබීමයි. එය ප්‍රතිසංස්කරණ-විරෝධීවාදයක් සහ ග්‍රන්ථයන් තුළ එල්බගත් ශුද්ධාත්මවාදයක් නිර්මාණය කිරීමට වෑයම් කිරීමකි.

සාම්ප්‍රදායික ආගමික ග්‍රන්ථ කේන්ද්‍ර කොටගත් සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය සියලු අංගෝපාංගයන්ගෙන් කොන්ෆියුසියානු දර්ශනය සමන්විත වූ බැව් පැරණි චීන සමාජයේ ස්වභාවය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ද පෙනේ. චීන අධිරාජ්‍යයේ පුද්ගලයන්ගේ බුද්ධිමය ප්‍රතිබද්ධතාවය අවබෝධ කර ගැනීමට ඇති එක් මාර්ගයක් නම් ආගමික ග්‍රන්ථ සම්ප්‍රදාය සොයා ගැනීම සහ එය ශිෂ්‍යයෙකුගේ හෝ ශිෂ්‍යාවකගේ අධ්‍යාපනය සහ පුහුණුවේ මාර්ගයක් වශයෙන් භාවිත කිරීමයි. එය පැරණි චීන සමාජයේ පොදු ආකල්පය වූ බැව් පෙනේ (Berthrong & Nagai-Berthrongohn, 2004: 55).

මෙහි බලපෑම අවුරුදු සහශ්‍රයක් (1912 දක්වා) චීනයේ බලපාන ලදී. මේ ක්‍රමය හරහා කොන්ෆියුසියානු පාසල් පොදු සමාජය සමඟ ඒකාබද්ධවීමක් දැකිය හැකි ය. මේ නිසා සමස්ත පුද්ගල ජීවිතය සහ ක්‍රියාවන් අන්‍යෝන්‍ය වශයෙන් ඒකාබද්ධ වූ බුද්ධිමය චීනයක් නිර්මාණය කිරීමට හේතු විය. නිලධාරීන් පමණක් නොව කවියන්, රචකයන්, නවකතාකරුවන්, කලාකරුවන්, ඉතිහාසඥයන්, උගතුන්, ගුරුවරුන්, සහ කුඩා ප්‍රතිශතයක උගත් කාන්තාවන් කොන්ෆියුසියානු ග්‍රන්ථවලින් සමන්විත විශ්වාස හා අදහස්වලින් ආකෘතිගත කොට ඇත (Gardner, 2014: 7). මේ නිසා ග්‍රන්ථගත අක්‍රීය කොන්ෆියුසියානු මූලධර්මයන් සමස්ත සාමාන්‍ය සමාජ සංස්ථාව තුළ ව්‍යාප්ත කිරීමට එම ග්‍රන්ථයන්හි සාරය උරාගත් විධිමත් බුද්ධිමය සිවිල් සමාජ පද්ධතියක් කොන්ෆියුසියානු දහම තුළ පැවැති බැව් පෙනේ. මෙය ආයතනගත සහ විධිමත් අධ්‍යාපන ක්‍රමයකට නිදර්ශනයකි. තවද, උගත් සමාජ කණ්ඩායම්හි චින්තනය සීමා සහිත ව පවත්වාගෙන යමින් සම්ප්‍රදායවාදී සමාජ ක්‍රමයක පැවැත්ම තහවුරු කර ගැනීමට සම්භාව්‍ය කෘති කේන්ද්‍ර කොටගත් අධ්‍යාපනයට හැකි වී ඇති බැව් පෙනේ.

**සමාජීය භූමිකා, ධූරාවලිගත සම්බන්ධතා සහ අධ්‍යාපන දර්ශනය**

හජිමේ නකමුරට (Hajime Nakamura, 2003) අනුව චීන චින්තා ලෝකයේ විප්ලවයක් කිසිවිටෙකත් නො වීය. ජීවිතය ස්ථාපිත වූ එකක් වීම මෙයට හේතුවයි (නකමුර, 2003 ඃ 246). මෙම සංස්ථාපිත භාවයට සාධක කොන්ෆියුසියානු දර්ශනය තුළින් ද දැකිය හැකි ය. ''මිනිස්සු ස්වභාවයෙන් සමාන වන අතර (ඔවුන්) සත්‍ය ක්‍රියාමාර්ග යන්ගෙන් (Actual practice) දුරස්ථ වන'' (Analects, 17.2) බැව් කොන්ෆියුසියස් ප්‍රකාශ කරයි. එනම්, පුද්ගලයා උත්පත්තියෙන් හෝ අභ්‍යන්තර මානව ස්වභාවය තුළින් එකිනෙකාගෙන් වෙනස් නොවන අතර බාහිර ව ලබන කිසියම් අනන්‍යතාවයක ආධාරය මත පුද්ගල වර්ගීකරණයකට ලක්වන බැව් මෙයින් ප්‍රකාශ වේ. රුයු හන්ග් (Ruyu Hung) ප්‍රකාශ කරන්නේ, වර්ගීකරණය සහ ධූරාවලිගතකරණය මගින් කොන්ෆියුසියානු ශ්‍රේණීන් (Confucian ranking) නිශ්චිත නියාමනයක් (Certain regulation) වශයෙන් තහවුරු කොට ඇති බවයි (Hung, 2015: 86).

''වංශවත්කම'' කොන්ෆියුසියානු සමාජ වර්ගීකරණයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. මෙම ලක්ෂණය පිළිබඳ මෙම සම්ප්‍රදායේ අර්ථ නිරූපණය සුවිශේෂී ස්වභාවයක් ගනී. ආතර් වැලීට අනුව වංශවත්කම පිළිබඳ අදහස එහි පාරම්පරික පදනමේ සිට හැසිරීමේ වංශවත්කම දක්වා දිවෙන අතර තම පවුලේ සම්භවය කුමක් වුවත්, මහත්මයෙකුගේ ක්‍රමයට, එනම් උතුම් තත්ත්වයට සුදුසු ආකාරයට හැසිරෙන ඕනෑම අයෙක් (Confucius., Waley, 2000: xix) වංශවතෙකුගේ ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. එහෙත් නකමුරගේ විග්‍රහය වෙනස් ස්වරූපයක් ගනී. ඔහුට අනුව කොන්ෆියුසියස්ගේ ඉගැන්වීම් නිදහස් අනුමාන ඔස්සේ නව සත්‍යක් සෙවීම අරමුණු කරගත්තක් නොවේ. ඔහු පුරාණ සම්ප්‍රදායන්ට පුනර් ජීවයක් දෙන අතර ම ඔහු විසූ කාලයේ පැවති සමාජ සංවිධානය හා පවුල් ක්‍රමය පිළිබඳ ඇගයුම් අනුකරණයට යත්න දරයි. ස්වකීය කාල වකවානුවේ පැවති සමාජ ක්‍රමය හෝ පවුල් සංවිධානය හෝ වෙනස් කිරීමේ අභිමානයක් ඔහු තුළ නොවී ය (නකමුර, 2003: 245-6). මෙය සත්‍ය නම් වංශවත්කම පිළිබඳ වැලීගේ අදහස සමඟ මෙය සමපාත නොවන්නේ වංශවත්කම පාරම්පරික පදනමෙන් මුක්ත වූ චර්යාවක් දක්වා විපරිවර්තනය කිරීමට කොන්ෆියුසියස් උත්සාහ කොට ඇතැයි වැලී විශ්වාස කරන බැවිනි. කොන්ෆියුසියස් පැරණි සමාජයට සාපේක්ෂව චෝ රාජ්‍ය ක්‍රමය ආශ්‍රය කොටගත් කිසියම් සමාජ සංස්කෘතික විපර්යාසයක් ඇති කිරීමට වෑයම් කළ ද, එම උත්සාහය ද නිදහස් චින්තනයෙන් තොර පාරම්පරික විශ්වාස සහ ලබ්ධීන්ට අනුගතව සිදු කිරීමට කොන්ෆියුසියස් උත්සාහ ගෙන ඇති ආකාරය නකමුරගේ පැහැදිලි කිරීමෙන් පෙනේ. එය එසේනම්, කොන්ෆියුසියානුවන් විශ්වාස කරනු ලබන උතුම් තත්ත්වය කිසියම් සීමා සහිත සහ චෝ සමාජ ක්‍රමයයෙහි සිරගත කොට තබන පුද්ගල හෝ සමාජ සංකල්පයක් වේ. ඒ අනුව, සමාජ ධූරාවලිගතකරණයෙන් පුද්ගලයා නිශ්චිත සීමාවක් තුළ ස්ථානගත කොට ඇති බැව් පෙනේ.

කොන්ෆියුසියානු දර්ශනයෙහි ධූරාවලිගතකරණයක් දැකිය හැකි වුව ද ඒ තුළින් පුද්ගල වටිනාකම්, වගකීම් සහ සමාජ සම්බන්ධතා පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට නොමැති බැව් පැවසිය නොහැකි ය. එය පුද්ගලයා පිළිබඳ ගැඹුරු දෘෂ්ටියකින් යුක්තවීම මෙයට එක් හේතුවකි. ඒවායෙහි පුද්ගලයා සහ සමාජය යන

පාර්ශ්වයන් දෙක ම පරිවර්තනය කිරීමේ (Transformation) මාධ්‍යයක් ලෙස අධ්‍යයනයේ සහ අධ්‍යාපනයේ වැදගත්කම ඇතුළත් වේ. එයින් පුද්ගලයා විසින් ප්‍රජාවට ස්වයං-පරිවර්තනය සහ ප්‍රජා ප්‍රතිශෝධකරණය ඇති කිරීම සහ හඳුනා ගැනීම මෙන් ම, සදාචාරාත්මක වගකීම් මනාව හුවමාරු කරගනු ලබන සමාජයන් මගින් පුද්ගලයාගේ පරිපූර්ණත්වය ලබා ගැනීම සහ හඳුනා ගැනීම සිදු වේ. කොන්ෆියුසියානු දර්ශනයට අනුව මෙම ස්වභාවයන් තුළින් වගකීම පිළිබඳ සංකල්පය නිර්මාණය වන බව පැවසිය හැකි ය (Taylor, 2014: VIII). මේ අනුව පුද්ගල චරිත වර්ධනයට අධ්‍යාපනය ආදේශ කරමින් සමාජ සංස්ථාව සිය දාර්ශනික අවශ්‍යතාවන්ට අනුව සැකසීමට කොන්ෆියුසියානුවන් උත්සුක වී ඇති බැව් පෙනේ.

සමාජය ආකෘතිගතකරණයේ දී කොන්ෆියුසියානුවන් ස්වකීය මූලධර්ම සියලු සමාජ සංස්ථාවන්ට අයත් පුද්ගලයන්ට ආත්මීගතකරණය කරයි. එහිදී, එම මූලධර්මයන් ඒකාකාරීව පවත්වාගෙන යෑම සඳහා ඇදහිලි සහ විශ්වාස අධ්‍යාපනික උපකරණයක් වශයෙන් භාවිත කොට ඇත. චීන සමාජය ප්‍රභූන්ට (elite) සහ නිර්ප්‍රභූවරුන්ට විධිමත් සහ අවිධිමත් ආකාරයෙන්, රජයේ ඍජු අනුදැනීම මත සමාජ ක්‍රියාකාරකම් සහ විශ්වාස හුරුකරවීමට පෙළඹී ඇත. එයින්, ඉහළ විභාග සඳහා පෙනී නොසිටිය ද ග්‍රාමීය පාසල් සඳහා ද කොන්ෆියුසියානු ඉගැන්වීම් සහ මූලධර්ම (Principle) මත පදනම් ව ඉගැන්වීම් කටයුතු සිදු කිරීමට ධෛර්යමත් කොට ඇත (Gardner, 2014: 96). මෙයින්, රජයේ සහ කොන්ෆියුසියානු විශ්වාසයන් අතර උග්‍ර වෙනසක් නොදැකිය හැකි අතර මොවුන් අධ්‍යාපනය ලබාදීමෙන් රාජ්‍යට අවශ්‍ය පරිදි සමාජ සංස්ථාව පවත්වා ගෙන යෑමට උත්සුක වී ඇති බැව් පෙනේ.

**අධ්‍යාපනය සහ රාජ්‍ය පාලනය**

කොන්ෆියුසියස් සමාජ හා දේශපාලන දර්ශනයන් ප්‍රචාරය කිරීමේ ප්‍රධානතම මාර්ගය කොට ගත්තේ අධ්‍යාපනයයි (කරුණාසිංහ, 2010ඃ 56). එනම්, මෙම අධ්‍යාපනයේ මූලික අරමුණු අතර ශිෂ්‍යයන් දේශපාලන ක්ෂේත්‍රයට යොමු කොට යහපත් දේශපාලන සංස්කෘතියක් බිහි කිරීම ප්‍රධාන අරමුණකි. තමන්ට අධ්‍යාපනය හරහා පැරණි චෝ සංස්කෘතියෙහි විභූතිය නැවත ප්‍රාණවත් කිරීමට සහ මධ්‍යම

රාජධානියේ සියලු මිනිසුන්ට ශිෂ්ට සමාජ ජීවිතයක් පොදුවේ පුනර් ජීවනය කිරීමට හැකි බැව් කොන්ෆියුසියස් අවබෝධ කර ගත්තේ ය (Berthrong & Nagai-Berthrongohn, 2004: 46). ඔහු මේ සඳහා පුරාණ ක්‍රමයක් වන චෞ රාජ්‍ය සමයේ සමාජ දේශපාලන ක්‍රමය දැක්වූ චෞ ආදිපාදවරයා දැක් වූ මාර්ගය හෙවත් ''චෞ චුං ලී'' මාර්ගය භාවිත කළේ ය (නකමුර, 2003: 246). මෙය පවතින සමාජය පෞරාණික ක්‍රමයකට අනුගත කිරීමට කරන ලද උත්සාහයකි.

අතීතයේ දී රාජ්‍යය සඳහා නිල ඉගැන්වීම ලෙස කොන්ෆියුසියානුවාදය පිළිගෙන ඇත. එමගින්, එහි ප්‍රායෝගික වර්ධනයක් සහ ව්‍යාප්තියක් සිදු විය. මේ නිසා, කොන්ෆියුසියානුවන්ට අනුව රාජ්‍යයේ මතවාද සහ චාරිත්‍ර විධිය නිර්මාණය වී ඇත. එය කොන්ෆියුසියානු අධ්‍යාපන ක්‍රමයේ පදනම බවට ද පත් වූ අතර සම්භාව්‍ය සාහිත්‍ය සම්ප්‍රදායන් අර්ථ නිරූපණය කිරීමේ දී සහ අවබෝධ කර ගැනීමේ දී ශ්‍රේෂ්ඨ රජවරුන් ද දිව්‍යාත්මයේ (Heavan) වරමට යටත් බව කොන්ෆියුසියස් කල්පනා කළේ ය (Berthrong & Nagai-Berthrongohn, 2004: 49). එක් අතකින්, කොන්ෆියුසියස් ''රාජ්‍ය පවත්වාගෙන යෑමේ වරම'' දාර්ශනික ව සාධාරණීකරණය කිරීමට පෙළඹී ඇතැයි උපකල්පනය කිරීමට හැකි ය. අනෙක් අතට, රාජ්‍ය විසින් ද මෙම සම්ප්‍රදායේ මතවාදයන්ට අනුව පාලන කටයුතු කිරීමෙන් රාජ්‍ය සහ කොන්ෆියුසියානු දර්ශනය කේන්ද්‍ර කොටගත් අධ්‍යාපනය අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක හා සහබද්ධ වීමක් පෙන්නුම් කරයි. එනම්, මෙය දේශපාලන බලය සහ බුද්ධිමය බලය එකිනෙකා වෙනුවෙන් කටයුතු කිරීමකි. මේ අනුව, කොන්ෆියුසියානු අධ්‍යාපන ආයතනයන් දේශපාලන බලය සංකේන්ද්‍රගත කිරීමේ එක් මෙවලමක් ලෙස භාවිත වී ඇතැයි උපකල්පනය කිරීම දෝෂ සහගත නොවේ.

කොන්ෆියුසියානු දර්ශනයෙන් රාජ්‍ය පාලනය පිළිබඳ සදාචාරාත්මක ඇගයුමක් සැපයේ. එනම්, යහපත් රාජ්‍ය පාලනය සියලු මිනිසුන්ට යහපත සලසන බැවින් කොන්ෆියුසියානු දර්ශනයට අනුව රාජ්‍ය සේවාව සියල්ලට ඉහළින් ඇත (Hoobler, 2009: 12). තවද, ඒකාධිපති රාජ්‍ය පාලනය මොහු අනුමත කරනු ලබන්නේ පාලකයා ගෘහමූලිකයෙකු ලෙස ක්‍රියා කිරීම සහ තමන්ගේ දරුවන්ට පියකු

මෙන් සිය යටත් වැසියන්ට කරුණාවන්ත සහ මහත්මා ගතියෙන් යුක්ත ව කටයුතු කිරීම හේතු කොටගෙන ය (Gardner, 2014).

කොන්ෆියුසියානු අධ්‍යාපනයේ අරමුණ ශාස්ත්‍ර ඥානය දියුණු කිරීම, ආචාරධර්ම පුහුණුව, භක්තිය හෝ පක්ෂපාතිත්වය දියුණු කිරීම සහ විශ්වාසය ගොඩනැගීමයි (කාරුණාසිංහ, 2010: 55). මෙවැනි බුද්ධිමය විග්‍රහයන් සමාජගත කිරීමෙන් රාජ්‍ය පිළිබඳ ධනාත්මක විශ්වාසයක් මහජනයා තුළ ඇති කිරීමට කොන්ෆියුසියස් පෙළඹී ඇතැයි පැහැදිලි ව පෙනේ.

## නිගමනය

කොන්ෆියුසියානු දර්ශනය සමාජීය හෝ සංස්කෘතික හෝ වෙනයම් හෝ සිද්ධි පාදක කරමින් නිර්මාණය වන ගැටලු දාර්ශනිකව විග්‍රහ කිරීමට වෑයම් කොට ඇත. විවිධ කොන්ෆියුසියානු දාර්ශනික විග්‍රහයන් අතර අධ්‍යාපනය පිළිබඳ දාර්ශනික විශ්ලේෂණය සියුම් හුයක් මෙන් එම දර්ශනයේ අන්තර්ගත ව ඇත. තවද, එම දාර්ශනික විග්‍රහයන්ගේ ලක්ෂණ සමස්ත දාර්ශනික අඩිගයන් ආවරණය සාකච්ඡා කළ හැකි වුව ද, එම අධ්‍යාපන දර්ශනය කිසියම් දෘෂ්ටිකෝණයකට පමණක් සීමා කොට විග්‍රහ කළ නොහැකි ය. එසේ සිදු කරන්නේ නම්, එම දාර්ශනික කාලාවකාශයට ආගන්තුක මිනුම් දඬු භාවිත කිරීමට සිදු වේ. එය දෝෂ සහගත වූවකි. මේ නිසා, මෙම විස්තරාත්මක අධ්‍යයනය කොන්ෆියුසියානු දර්ශනයේ පවතින අධ්‍යාපනික ලක්ෂණ කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් කොන්ෆියුසියානු අධ්‍යාපන දර්ශනයේ ස්වභාවය විමර්ශනය කොට ඇත.

## ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය

කරුණාසිංහ, එම්. (2010). *චීන දර්ශනය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නකමුර, එච්. (2010). *පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි*. පී. බී මීගස්කුඹුර (පරි.). විසිදුනු ප්‍රකාශකයෝ.

Merriam-Webster. (n.d.). S*cholar. In Merriam-Webster.com dictionary*. Retrieved March 20, 2025, from https://www.merriam-webster.com/dictionary/scholar

The Editors of Encyclopaedia Britannica (2024, November 7). Zhougong. *Encyclopedia Britannica*. https://www.britannica.com/biography/Zhougong

Britannica, The Editors of Encyclopaedia. (2024, April 1). Ban Zhao. Encyclopedia Britannica. https://www.britannica.com/biography/Ban-Zhao (Accessed October 27, 2024).

Berthrong, J., & Nagai-Berthrong, E. (2004). *Confucianism: A short introduction*.Oneworld Publications.

Confucius, & Waley, A. (2000). *The Analects*. Alfred A. Knopf.

Csikszentmihalyi, M. (2024). Confucius. In E. N. Zalta & U. Nodelman (Eds.), *The Stanford Encyclopedia of Philosophy* (Summer 2024 Edition).

Elstein, D. (n.d.). Xunzi. Internet Encyclopedia of Philosophy. Retrieved October 22, 2024, from https://iep.utm.edu/xunzi/

Gardner, D. K. (2014). *Confucianism: A very short introduction*. Oxford University Press.

Hansen, M. H. (1999). *Education and Chinese minority policy. In Lessons in being Chinese: Minority education and ethnic identity in Southwest China* (pp. 24–56). University of Washington Press.

Hung, R. (2015). *A critique of Confucian learning: On learners and knowledge*. Educational Philosophy and Theory, 48(1), 85–96. https://doi.org/10.1080/00131857.2015.1084220

Knoblock, J. (1988). Xunzi: *A translation and study of the complete works* (Vol. 1). Stanford University Press.

Littlejohn, R. L. (2011). *Confucianism: An introduction*. I.B. Tauris & Co Ltd.f

Taylor, R. L. (2014). *The illustrated encyclopedia of Confucianism*. The Rosen Publishing Group, Inc.

Van Norden, B. W. (2009). *The essential Mengzi*: *Selected passages with traditional commentary* (Abridged ed.). Hackett Publishing Company.

Weber, M. (1959). *The religion of China: Confucianism and Taoism*. The Free Press.

Yao, X. (2000). *An introduction to Confucianism*. Cambridge University Press.